# සිනුවර හසුන

## සිඩ්නි සිට ලියමි



ශ්‍රී ලංකාව පිහිටා තිබෙන්නේ ආසියා මහාද්වීපයේ බව අපි කුඩා කල භූගෝල විද්‍යා පාඩමේ දී උගත්තෙමු. එහෙත් පෝලින් හැන්සන්ලා සහ ඒ පමණක් නොව පොදුවේ මහා ඕස්ට්‍රේලියානු සමාජයේ සාමාජිකයින් ද ආසියාතිකයින් යැයි කියන විට එයින් අදහස් කරන්නේ සුවිශේෂීව චීන, වියට්නෑම් ජාතිකයින් සහ පොදුවේ කියනවා නම් කහ හම ඇත්තන් වේ. කැමති වුනත් අකමැති වුනත්, අප අයත් වන්නේ පොදුවේ ඉන්දියානුවන් යැයි හැඳින්වෙන ජන කොට්ඨාශයටය.
කවරෙකු හෝ මා ඉන්දියානුවෙක් යැයි හඳුන්වනවාට මගේ කිසිදු කැමැත්තක් නැත. මෙය මට ඕස්ට්‍රේලියාවේදී නිතරම ද, මා පසුගිය සිනුවර කොලමක දැක්වූ පරිදි ශ්‍රී ලංකාවේ දී දෙතුන් වරක් ද මුහුණ පාන්නට වුනු තත්වයකි. එවැනි අවස්ථාවල දී මා ඉන්දියානුවෙක් නොව ශ්‍රී ලාංකිකයෙක් යනුවෙන් මම එය වහා නිවරද කරමි.

මා එසේ කරන්නේ, ඉන්දියන් සාම සාධක හමුදාව ලංකාවේ සිටි කාලයේ අපේ ඇතමුන් විසින් දියත් කරන ලද ඉන්දියන් විරෝධී ව්‍යාපාරය හෝ ඉන් පසුවත් විටින් විට ඉන්දියානු මධ්‍යම රජය විසින් ලංකාවේ ජනවාර්ගික යුද්ධයට විසඳුමක් සොයන්නට මැදිහත් වන විට ලංකාවේ පැතිර ගිය ඉන්දියානු විරෝධය වැනි දේශපාලන ව්‍යාපාරක් නිසා නොවේ. හුදෙක් ඇත්ත ඇති සැටියෙන් දැක්වීම උදෙසාය.

අප සියළු දෙනාම එසේ යැයි මෑතක් වනතුරුම මා සිතා සිටියද ලඟදී දිනක එය වෙනස් විය. ඒ එක් කතාවක් නිසා නොව එක වාගේ කතා දෙකක් නිසාය. ඒ කතා සැකෙවින් මෙසේය.
මින් පලමුවැන්න මා පුවත්පතක කියවූවකි. අපේ සිංහලයෝ බොහෝ අය -දඹදිව වන්දනාවේ" යති. මින් සමහරු ඉන්දියාවේද සංචාරය කරති. ඉන්දියාවට යන කවරෙකු වුවද නැරඹීමට ආශා කරන එක් ස්ථානයක් නම්, ටජ්මහල් ප්‍රාසාදයයි.

අප ජීවත්වෙන ඕස්ට්‍රේලියාවේ මෙන් නොව අප ජීවත් වූ ලංකාවේ මෙන්, ඉන්දියාවේ සංචාරකයින් ගැවසෙන ස්ථානවල දී ස්වදේශිකයින් ට සහ විදේශිකයින් ට සැලකෙන්නේ දෙ ආකාරයකටය. ඒ ප්‍රවේශ පත්‍ර සම්බන්ධයෙනි. ටජ්මහල නැරඹීම සඳහා අවශ්‍ය ටිකට් පත් මිලට ගැනීමේදී මෙය ස්වදේශිකයින් ට රුපියක් විස්සක් සහ විදේශිකයින් ට ඩොලර් විස්සක් වැනි විශාල අසාධාරණ පරතරයක් දක්වා විහිදී ඇති බව සැලයි. ලංකාවේ සිට ටජ්මහල නරඹන්නට යන අයට මෙය විශාල මුදල් ප්‍රමාණයකි.

පුවත් පතේ සඳහන් ප්‍රවෘත්තියට අනුව, ලාංකික සංචාරකයින් මෙහිදී අනගමනය කරන උපක්‍රමය වන්නේ ඉන්දියානුවන් සඳහා වන පෝලිමේ ගොස්, ඉන්දියානුවන් යැයි හඟවා අඩු මිල ටිකට් මිලට ගැනීමයි. මෙහිදී පාස්පෝට්, වීසා බැලීමක් නොමැති නිසා කාර්යය ඉතා පහසුවේ. අපේ ඉන්දීය විරෝධය කෙසේ වෙතත් ශ්‍රී ලාංකික අභිමානය ඩොලර් කිහිපයකට ක්ෂණිකව විකිණී යයි.
ඉන්දියාවේ ප්‍රාන්ත භාෂා සිය ගණනක් ඇති නිසා කතා බහේ උශරුවෙන් යමෙකුගේ ගම් පලාත සෙවිය නොහැක. ටිකට් අලෙවි කරන්නන්හට මෙහිදී යම් සැකයක් ඇතිවුණ හොත් ඔවුන් කරනුයේ, ඔබ කොහේ සිටදැයි විමසීමය.

අපේ ඇත්තෝ මෙහිදී තවත් එක සිංහල අභිමානයක් ඉවත දමා අපි තමිල්නාඩුවෙන් යැයි පවසති. කීප දෙනෙක් මෙලෙස පවසා අඩු මිළ ටිකට් මිලදී ගත්තාට සැකයක් නැත. මේ බව ආරංචි වී ඇති නිසාදෝ, පෙර කී පුවත්පත් වාර්තාවට අනුව, දැන් ඔවුන් කරනුයේ තමිල්නාඩුව ගැන සාමාන්‍ය දැනීමේ ප්‍රශ්ණ විමසීමයි. සමාව ගෙන විදේශීය ටිකට් පෝලිමට යනවා මිස අපේ ඇත්තන් ට කළ හැකි වෙනත් දෙයක් නොමැත.

මුදල් හමුවේ ශ්‍රී ලාංකිකත්වය, සිංහලකම හෑල්ලුවට ලක් වීමේ මුල් කතාව එසේය. එහිදී අපේ ලාංකික සංචාරකයින් එසේ කරනුයේ ඩොලර් විස්සක් යනු ලංකාවේ මුදලින් සැලකිය යුතු ප්‍රමාණයක් නිසා යැයි සිතිය හැක. මේ දකුණු කුරු දිවයින හෙවත් ඕස්ට්‍රේලියාවේ වසන අපේ ඇත්තන් නම් එසේ නොකරතැයි ඔබ සිතනවා නම් එය මුලාවකි.

මා ඇසූ පෙර කී දෙවන කතාවට අනුව, දඹදිව ගොස් තලගොයි මරන්නට තජ්මහල් ගිය ඔසී නිවැසි සිංහල පිරිසක් කර ඇත්තේ, මේ ටිකට් මිලදී ගැනීම උදෙසාම සල්වාර් කමීෂ් කට්ටල මිලට ගෙන සැරසීමයි. ඔවුන් ගේ මේ වෙස් මාරුව කෙතරම් සාර්ථක වීද යත්, ඔබ කොහේ සිටද යන පැණයෙන් මිදී ඩොලර් කිහිපයක වාසියක් ලබා ගැණීමට ඔවුනට හැකිවී ඇත. එපමණක් නොව, මිල දී ගත් ඒ සල්වාර් කමීෂ් කට්ටල ඉඳහිට හෝ සාදයකට ද ඇඳිය හැකි වීම ප්‍රසාද දීමනාවක් සේ යැයි මේ හපන්කම කළ මා මිතුරා පැවසීය.
ඩොලර් වාසි තකා අපේ අය තාවකාලිකව ඉන්දියානුවන් වන්නේ එසේය. ඒ කෙසේ වෙතත්, අප ඇත්තටම ඉන්දියානුවන් විය යුතු නම් ඒ කුමක් නිසාදැයි මට පසුගිය දිනක මගේම අත්දැකීමකින් වැටහිණ.

ලංකාවේ මිනිහෙක් විශේෂයෙන් ම සිංහල බෞද්ධයෙක් ඕස්ට්‍රේලියාවේ දී හඳුනා ගත හැකි නිවරදි, අත්දුටු ක්‍රමයක් වරෙක පවසා සිටියේ මෙල්බර්න් නුවර වැඩ වසන හාමුදුරුනමකි. මෙය මට පෞද්ගලිකව පැවසූවක් නොව ප්‍රසිද්ධියේ කියා කුමක් හෝ පොතක හෝ ලිපියක තිබී මා කියවූවකි. එය මෙසේය.

ඔබ පාරක, තොටක, හෝ වෙනයම් ප්‍රසිද්ධ ස්ථානයක ගැවසෙන විට කිසිවෙක් ඔබ දැක, වහා ඉවත බලා ගත්තේ නම්, ඒ ශ්‍රී ලාංකිකයෙකි, සිංහලයෙකි, (මේ කියන්නේ හාමුදුරුනමක් නිසා) බෞද්ධයෙකි.

හොඳින් සිංහලෙන් කතා කරමින් හිඳ, අප ඔවුන් අසලින් යන විට ඉංගිරිසියට බසින උදවිය අප කොතෙකුත් දැක ඇත්තෙමු. මේ සිංහල අපේ මානසිකත්වයයි.

දැන් මගේ අත්දැකීම ඔබ හා බෙදා ගැනීමට කාලයයි.

ව්‍යායාමය සඳහා ඇවිදීම මම කලක සිට කරමි. මා වසන උද්‍යානයක් බඳු වූ තදාසන්න ග්‍රාමයේ මේ සඳහා පාර දෙපස ඉදිකර ඇති පා මග දිගින් කිලෝ මීටර් සිය ගණනකි. ජනාශූන්‍ය සමහර තැන්වල පමණක් මේ පා මග විහිදෙන්නේ පාරේ එක් පසෙකින් පමණි.

දිනක් සවස ඇවිදිමින් සිටි මා මෙවැනි එක් ස්ථානයකට පැමිණ පාරෙන් එහා පැත්තේ ඇති පා මගට පිවි-සෙන්නට හිතනවාත් සමගම දුටුවේ ඒ මගෙහි මා යන දිසාවටම සෙමෙන් ඇවිද යන ඉන්දියානුවෙකි. ඇඳ සිටි සල්වාර් කමීෂ් ඇඳුමින් සහ බැඳ සිටි ජටාවෙන් ඔහු සැබවින්ම ඉන්දියානුවෙක් බව මට පසක් විය. මා ඒ පසට ගොස් ඇවිදීම ඇරඹුව හොත් මට ස්වල්ප මොහොතකින් ඔහු පසුකර යාමට සිදුවේ. එතැන දී ඔහු හා සිනාසීමට සහ බොහෝ විට කතාබහ කිරීමට සිදුවේ. මෙයින් මගේ ගමන බාල වී, අභ්‍යාසය බිඳ හෙලෙනු ඇත. මා සිත තුල ඇතිවූ ඒ හැඟීම නිසාම පාරේ අනෙක් පසට නොගොස් පා මගක් නොමැති මේ පසෙහිම තණ බිස්ස දිගේ මම ඇවිදීමට පටන් ගත්තෙමි.

ඔහු ට සමාන්තරව ගමන් කරමින් ඔහු පසුකර ස්වල්ප මොහොතකට පසු මට ඒ ඉන්දියානුවා දෙස බැලුනේ නිතැතිනි. ඒ ඉන්දියානුවා ද මා දෙස බලා සිටියා විය යුතුය. මා එදෙස බැලූ සැනෙකින්ම අත් එක්කර එසවූ ඔහු නමස්තේ යැයි මට ආචාර කලේය. මා ද ක්ෂණිකව ප්‍රති-ආචාරය දැක්වූයේ, එතැන් සිට මේ මොහොත දක්වාම මට වද දෙන පසුතැවිල්ලක් මා සිත තුල ජනිත වෙනවාත් සමගමය.

මේ බහු සංස්කෘතික රටේ අප ඉගෙන ගතයුතු තව කෙතරම් දේ ඇද්ද?

**සිනුවර ආරච්චිල** <sinuwara.arachchila@gmail.com>

**නා**ට්‍ය රස වින්දනය රස වින්දනය පුරුදු පුහුණු කර ලබා ගත යුතු හැකියාවකි. ඒ සඳහා අපේ සමාජය පොළඹවන ගාමක බලවේගයක් තිබිය යුතු ය. හරසුන් අවර ගණයේ විසූක දස්සන නාට්‍ය ලෙස හඳුන්වමින් අපේ වේදිකා මත දිග හැරෙන යුගයක ඒ අවර ගණයේ නාට්‍ය නරඹා මොට කරගත් රසඥතාවෙන් යුත් ප්‍රේක්ෂකාගාරයක් බිහි වීමේ අවදානමක් ඇති යුගයක සැබෑ නාට්‍ය යනු කුමක් දැයි හඳුන්වාදීමේ වැඩ පිලිවෙලක අවශ්‍යතාව දැන් තදින්ම ඇත.

ඔස්ට්‍රේලියාවේ වේදිකා ගත වුණ ඉතා උසස් ගණයේ නාට්‍ය රැසකි. මාලිනී ජයසිංහ හා ශ්‍යාමොන් ජයසිංහ යුවල කැපී පෙනෙයි.

මේ කිසිවකුට ස්ව ශක්තියෙන් සැබෑ නිර්මාණ අපේ සමාජයට ඉදිරිපත් කිරීමේ ආර්ථික ශක්තියක් නැත. ඒ සඳහා යම් යම් සංවිධාන වල ශක්තිය ඇවැසි වෙයි. මේ සමාජයේ බොහෝ සාංවිධාන මුදල පෙරට දමමින් ඒ කාර්යය මග හැර යද්දී ඒකතරා කුඩා නමුත් ශක්තිමත් සංවිධානයක් පෙරට ඒම අපේ සතුටට හේතු වෙයි. ඒ ලක් මැදුර සංවිධානයයි. ඔවුන්ගේ ඉදිරි සැළසුම් සඳහා මුදල් අවශ්‍යතාව මහා පරිමානයෙන් තිබුණත් මුදල නොව සැබෑ කලාව යන අරමුණ පෙරට ගනිමින් රෝමය ගිණි ගනී, සුබ සහ යස වැනි දැවැන්ත නිර්මාණ ඒවාට



# සැබෑ රස වින්දනයක් උදෙසා...

විසින් මහත් වැර වෑයමෙන් ගොඩ නගන්නට උත්සාහ කළ සහ ඒ උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස ගොඩ නැගෙමින් පවතින සැබෑ රසවින්දනය තවත් ඉහළ නැංවීම සඳහා යම් කැපවීමකින් ඉදිරිපත් වන ආයතන හා පුද්ගලයින් විරලය. පළමු වතාවට ඔස්ට්‍රේලියාවට පූර්ණ නාට්‍ය කණ්ඩායමක් ලෙස පැමිණියේ 2003 වසරේ දී -පාදඩ අසපුව" නාට්‍යයයි. ජගත් ජේ එදිරිසිංහ විසින් සංවිධානය කළ ඒ සංචාරයට සහභාගිවීමේ භාග්‍යය මම ද වින්දෙමි. එයින් ඇරඹුණ පූර්ණ නාට්‍ය කණ්ඩායම් පැමිනීම ඔස්ට්‍රේලියාව තුළ නියම නාට්‍ය රස වින්දයක් ඇති ප්‍රේක්ෂකාගාරයක් බිහි කිරීමේ ලා මහත් සේවයක් ඉටු කළේය.

හුදු මුදල් ඉපැයීමේ පටු පරමාර්ථයෙන් විවිධ පුද්ගලයන්ගේ මුල් වීමෙන් පසුගිය වකවානුවේ නාට්‍ය නමින් හරසුන් අසභ්‍ය මන්ද බුද්ධික සන්දර්ශන ප්‍රෙක්ෂකයන් හමුවේ දිග හැරෙනු අපි බලා සිටියේ මහත් කම්පාවකිනි. මේවායින් අපේ නාට්‍ය රසිකයන්ට ලබා දුන් වැරදි පූර්වාදර්ශ බොහෝ ය. මුදලට වහල් වී කරමින් යන මේ අකටයුත්ත යන්තමින් හෝ මගහරවන්නට මුල් වූ අය අතරින් රෝහණ කරුනාරත්න, ගාමිණී රණසිංහ, යශෝධා සරච්චන්ද්‍ර, කුසුම්සිරි ලියන-ාරච්චි, අජිත් සිල්වා, වැනි ශිල්පීන් හා ශිල්පිණියන් ද මනමේ, මහාසාර වැනි නාට්‍ය මෙල්බර්න් වෙසෙන ශිල්පීන් යොදා නිශ්පාදනය කළ ස්කැට්ස් සංවිධානයද සහභාගි වූ සියලුම ශිල්පීන් සමගින් ඔස්ට්‍රේලියාවේ ශ්‍රී ලාංකික ප්‍රේක්ෂකයන් උදෙසා පිරි නැමීම අගය කරන්නට සුදුසු වචන සොයා ගන්නට මම අපොහොසත් වෙමි.

ලක් මැදුර පදනමේ සභාපති කෙනත් පාඩිකෝරාල, ලක්බණ ප්‍රනාන්දු, ශාන්ත සුබසිංහ, සමන් රන්වල, මහින්ද හේවා-වසම්, ධම්මික තිස්සආරච්චි සහ මෙම කාර්යයට උර දුන් එහි සියලු දෙනාටම අපේ ස්තුතිය හිමි වෙයි. එසේම මේ සත් කාර්යයට අනුග්‍රහය දැක් වූ ට්‍රාන්ස්කෝ ඉන්ටනැෂනල් ආයතනයටත් අජිත් මාම්පිටිය මහතාටත් අපේ කෘතඥතාව හිමිවිය යුතු ය.

සියල්ල මුදලට යටවී යන මෙවන් යුගයක මෙවන් උඩු ගං බලා පිහිණන මානවයන්ගෙන් සැදුණ සංවිධාන දැක ගන්නට ලැබීමත් ඒ ඇසුරේ වෙසෙන්නට ලැබීමත් අප පෙර කළ පිනක් යයි මට සිතෙයි.

ලක් මැදුර පෙන්වූ මේ පෙරමග අනෙක් දැවැන්ත සංවිධාන ද ආදර්ශයට ගනු ඇතැයි මම සිතමි.

ලක් මැදුරේ ඉදිරි සියලු කටයුතු සාර්ථක වේවායි පතමි.

ශ්‍රීනාත් මද්දුමගේ

